museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2023 නොවැම්බර්

**World Monuments Fund විසින් MMCA ශ්‍රී ලංකාහි 'අක්කර 88' නිල වශයෙන් අනුමත කරයි**

ලෝකයේ වටිනාම ස්ථාන සුරැකීම සඳහා කැපවී සිටින ජාත්‍යන්තර ස්වාධීන සංවිධානයක් වන World Monuments Fund (WMF) විසින් ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ (MMCA ශ්‍රී ලංකා) ප්‍රදර්ශනය වන 'අක්කර 88: මිනෙට් ද සිල්වාගේ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය' නිල වශයෙන් අනුමත කර ඇත. මෙම ප්‍රදර්ශනය, කොළඹ 3, ක්‍රෙස්කැට් බුලෙවාඩ්හි බිම් මහලේ පිහිටි කෞතුකාගාරයේ දැන් පැවැත්වෙන අතර, එය 2023 ජූලි 7 දක්වා මහජනතාවට විවෘතව පවතී.

WMF වෙතින් ප්‍රදර්ශනයට ලැබුණු පිළිගැනීම පිළිබඳව කතා කරමින් MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා පැවසුවේ, "මෙය ශ්‍රී ලාංකීය නූතන ගෘහ නිර්මාණ ශිල්පය සම්බන්ධයෙන් WMF ලබාදුන් පළමු අනුමැතිය වන අතර, එය ගෝලීය දකුණේ දේශීය කලා හා ගෘහ නිර්මාණ ශිල්පීය ඉතිහාස ජාත්‍යන්තර මට්ටමින් පිළිගැනීමට අත්‍යවශ්‍ය තල්ලුවක් සපයනවා" යනුවෙනි." ඇය තවදුරටත් කියා සිටියේ, "1948 දී බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනය (RIBA) විසින් පිළිගත් ප්‍රථම ආසියානු ගෘහ නිර්මාණ ශිල්පිනිය මිනෙට් ද සිල්වායි. ගෘහ නිර්මාණ ශිල්පයට ඇය ලබාදුන් දායකත්වයට විචාරාත්මක පිළිගැනීමක් ඇයගේ ජීවිත කාලයේ නොලැබුන නිසා මෙම අනුමැතිය තවත් සුවිශේෂයි. ද සිල්වාගේ කාර්යය පිළිබඳව සාකච්ඡාව හා ගවේෂණය ඉදිරියට රැගෙන යාමට WMF සමඟ එක්ව වැඩකිරීම MMCA ශ්‍රී ලංකාවට ගෞරවයක්" කියා ය.

මහනුවර වටපුළුව නිවාස යෝජනා ක්‍රමය 1958දී සාදා නිමකෙරුණු අතර, එය ශ්‍රී ලංකාව තුළ සමාජ නිවාසකරණයේ නව ස්වරූපයක පෙරමඟ දැන්වූයේ ය. ගෘහ නිර්මාණ ශිල්පී මිනෙට් ද සිල්වා විසින් නිර්මාණ සැලසුම්කරණය කළ මෙම යෝජනා ක්‍රමය විශේෂයෙන් ම එහි පරිශීලකයන්ගේ සහභාගීත්වයෙන් නිර්මාණයකෙරුණි. ශ්‍රී ලංකාවේ බහුවිධ වාර්ගික-ආගමික රාජ්‍ය සේවකයින් ප්‍රජාවකට දැරිය හැකි මිලකට නවාතැන් සපයා දුන් මෙම විශාල භූමි භාගයක විසිරුණු කඳුකර සංවර්ධනය, එම යුගයට පෙරටුව සිටියේ කෙසේදැයි යන්න 'අක්කර 88' ගවේෂණයකරයි. ඉරුෂි තෙන්නකෝන් (උ. 1989), සුමේධ කැලේගම (උ. 1988), සහ සුමුදු අතුකෝරල (උ. 1980) නිර්මාණයකළ විශේෂයෙන් පැවරුණු කලාකරුවන්ගේ චිත්‍රපටයක් සමඟින් 'අක්කර 88' මෙම යෝජනා ක්‍රමය දෙස වසර 65කට පසුව හැරී බලන්නේ ද සිල්වාගේ බලපෑම සහ ඇගේ නිර්මාණ ප්‍රවේශයේ අභියෝග සළකා බැලීමටයි.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

MMCA ශ්‍රී ලංකා සහ WMF යන ආයතන දෙකට ම වැදගත් සන්ධිස්ථානයක් වන මෙම අනුමැතිය ආමන්ත්‍රණය කරමින් World Monuments Fundහි ව්‍යාපෘති අධ්‍යක්ෂ ජෝන් ඩාලින්ටන් පැවසුවේ, “මිනෙට් ද සිල්වා යනු විශිෂ්ට ගෘහ නිර්මාණ ශිලිපිනියක්. එඩිතර, නිර්මාණශීලි, හා ප්‍රගතිශීලී චරිතයක්වූ ඇය, ශ්‍රී ලංකාව තුළ මෙන් ම අන්තර්ජාතික මට්ටමේ පිළිගැනීමකට පාත්‍ර විය යුතු පුද්ගලයෙක්. ඇයගේ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය කලාකරුවන්, යහළුවන්, හා එහි වෙසෙන අයගේ ඇස්වලින් සුවිශේෂ ලෙස ගවේෂණය කරන ‘අක්කර 88’ ප්‍රදර්ශනය World Monuments Fund විසින් අනුමත කරන්නේ ඉතා සතුටින්” යනුවෙනි. ඔහු තවදුරටත් කියා සිටියේ, “ඇගේ ගොඩනැගිලි පමණක් නොව ප්‍රවේශය ද ඇතුළත්මිනෙට්ගේ පුළුල් උරුමය වෙත අවධානය යොමු කිරීමට MMCA ශ්‍රී ලංකා හා අනිත් සහකරුවන් සමඟ එක්ව වැඩ කිරීමට අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා” කියා ය.

‘අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය’ ප්‍රදර්ශනයෙහි ‘is this an architectural documentary?’ (2023) නම් වූ කලාකරුවන්ගේ චිත්‍රපටය පසෙකින් ඡායාරූප, ප්‍රකාශන, ඓතිහාසික ලේඛන, ස්ථාපන, සහ වාස්තු විද්‍යාත්මක සිතුවම් හා ආකෘති ප්‍රදර්ශනයකෙරෙනු ඇත. මෙම සජීවිකරණ වාර්තා චිත්‍රපටය 2023 නොවැම්බර් 30 සිට 2024 ජුලි 7 වනදා දක්වා ‘අක්කර 88’ මහජනයාට විවෘතව තැබෙන කාලය තුළ තිර දැක්වෙනු ඇත. ප්‍රදර්ශනය සහ කලාකරුවන්ගේ චිත්‍රපටය ශ්‍රී ලංකා බ්‍රිතාන්‍ය කවුන්සිලයේ අරමුදල්වල සහායෙන් කළ හැකි විය.

ප්‍රදර්ශනයට සහයෝගය දක්වමින් ඕලැන්ඩෝ එඩ්වර්ඩ්ස් කියා සිටියේ, “‘අක්කර 88’ නම් MMCA ශ්‍රී ලංකාහි නව ප්‍රදර්ශනයට සහාය වීමට ලැබීම අපිට ආඩම්බරයක්. ලෝක ස්මාරක අරමුදල (WMF) විසින් පිළිගැනීමට පාත්‍රවීම සහ MMCA ශ්‍රී ලංකා සමග ඇතිවන මෙම නැගී එන හවුල්කාරීත්වය ශ්‍රී ලාංකීය ගෘහ නිර්මාණ ශිල්පය, උරුමය, සහ ප්‍රශංසා නොලැබූ ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පියෙකු වන මිනෙට් ද සිල්වාගේ ප්‍රතිරූපය ඉහළ නැංවීමේ වැදගත්කම සඳහා විශිෂ්ට පුවතක්” බවයි. “බ්‍රිතාන්‍ය කවුන්සිලයේ අපි පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත නිර්මාණ ගෙනයාම, සංජානනයන්ට අභියෝගකිරිම සහ සමාජ, දේශපාලන, සහ පාරිසරික සන්දර්භයන්ට ප්‍රතිචාර දැක්වීමේ වටිනාකම විශ්වාසකරන අතර, ‘අක්කර 88’ කරන්නේත් එයයි” යනුවෙන් ඔහු වැඩිදුරටත් පැවසීය.

පිළිබඳව

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) යනු සාමාන්‍ය ජනතාව, පාසල්, මෙන් ම සංචාරකයන්ගේ ද ප්‍රයෝජනය හා රසවින්දනය සඳහා නූතන සහ සමකාලීන කලා කෘති ප්‍රදර්ශනය, පර්යේෂණය, රැස්කිරීම, සහ සංරක්ෂණය වෙනුවෙන් කැප වූ පොදු කෞතුකාගාරයක් පිහිටුවීම අරමුණු කරගත් අධ්‍යාපනය පෙරටුකරගත් මුලපිරීමකි. කෞතුකාගාරය දිනපතා (පෝය සහ මහජන නිවාඩු දිනවල හැර) පෙ.ව. 10–ප.ව. 6 දක්වා කොළඹ 03, ක්‍රෙස්කැට් බුලෙවාර්ඩ්හි බිම් මහලේ විවෘතව ඇති අතර, කෞතුකාගාරයට ඇතුළුවීම සහ එහි සියලු ම මහජන වැඩසටහන් නොමිලේ ය. කෞතුකාගාරය සහ, එහි ප්‍රදර්ශන හා මහජන වැඩසටහන් පිළිබඳ තොරතුරු ඔවුන්ගේ වෙබ් අඩවියෙන් www.mmca-srilanka.org/ හෝ ෆේස්බුක් facebook.com/mmcasrilanka සහ ඉන්ස්ටග්‍රෑම් instagram.com/mmcasrilanka/ පිටුවලින් ලබාගත හැක.

ලෝක ස්මාරක අරමුදල (WMF) යනු මිනිසුන්ගේ ජීවිත සාරවත් කිරීම සහ සංස්කෘති හා ප්‍රජා අතරේ අන්‍යෝන්‍ය අවබෝධතාව ගොඩනැගීම අරඹයා ලෝකයේ වටිනා ම ස්ථාන ආරක්ෂා කිරීමට කැපවී සිටින ප්‍රධාන ම ස්වාධීන ආයතනයයි. අපගේ නිව් යෝර්ක් නගරයේ පිහිටි මූලස්ථානයට අමතරව, කාම්බෝජය, ප්‍රංශය, ඉන්දියාව, පේරු, පෘතුගාලය, ස්පාඤ්ඤය, හා එක්සත් රාජධානියෙහි කාර්යාල හා අනුබද්ධ ආයතන ඇත. 1965 සිට අපගේ ජාත්‍යන්තර කණ්ඩායම විසින් ඉහළ ම ජාත්‍යන්තර ප්‍රමිතීන් යොදා ගනිමින් රටවල් 112 පිහිටි අඩවි 700කට අධික ප්‍රමාණයක් හරහා ලෝකයේ විවිධත්වයෙන් යුතු සංස්කෘතික උරුමය සංරක්ෂණය කර ඇත. දේශීය ප්‍රජා, අරමුදල් සපයන්නන්, හා ආණ්ඩු සමඟ හවුල්ව කටයුතු කරන WMF, උරුම සමඟ නියැලෙන්නේ වර්තමානයේ ඇති වඩාත් ත්‍රීව අභියෝග සමහරක් වන දේශගුණික විපර්යාසය, අඩු නියෝජනය, සංචාරක කර්මාන්තයේ අසමබරතාවය, හා පශ්චාත් අර්බුද ප්‍රතිසාධනය ආමන්ත්‍රණය කිරීමටයි. විවිධ ස්ථානවලට ජීවයක් ලබා දෙන මිනිසුන් වෙනුවෙන් කැපවී සිටින WMF අතීතයේ විභවය වැලඳ ගන්නේ වඩාත් ඔරොත්තු දෙන හා අන්තර්ග්‍රාහී සමාජයක් බිහි කිරීමටයි.

බ්‍රිතාන්‍ය කවුන්සිලය යනු සංස්කෘතික සබඳතා සහ අධ්‍යාපන අවස්ථා සඳහා එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සංවිධානයයි. අපි කලාව හා සංස්කෘතිය, අධ්‍යාපනය, සහ ඉංග්‍රීසි භාෂාව හරහා එක්සත් රාජධානිය සහ වෙනත් රටවල් අතර සබඳතා, අවබෝධය සහ විශ්වාසය ගොඩනගමු. පසුගිය වසරේ, අපි අන්තර්ජාලය, විකාශන සහ ප්‍රකාශන හරහා සෘජුව මිලියන 80කට අධික ජනතාවක් සහ සමස්තයක් ලෙස මිලියන 791ක ජනතාවක් වෙත ළඟාවුණෙමු. 1934දී ප්‍රතිස්ථාපනයකළ අපි, රාජකීය ප්‍රඥප්තිය විසින් පාලනයකරනු ලබන එක්සත් රාජධානියේ පුණ්‍යායතනයක් සහ එක්සත් රාජධානියේ පොදු ආයතනයකි. අපට, එක්සත් රාජධානී රජයෙන් සියයට 15ක මූලික අරමුදල් ප්‍රදානයක් හිමිවේ.